# ගොවි කටයුතු වලදී දක්වුනු අදහස් කෙටියෙන්

1. සමුපකාර සමිති වී මිළට ගන්නා විට ගෝනිය සඳහා අඩුකරන බර ප්‍රමාණය පළාතෙන් පළාතට රාත්තල් 2 1/2 සිට රාත්තල් 5 දක්වා වෙනස් වේ.

2. වී එක් එක් ශ්‍රේණිවලට වෙන් කිරීම සමුපකාරයේ කළමනාකාර මහතාගේ හිතු මනාපයට කෙරෙන බව පෙනෙන්නට තිබේ. එකම ගොවියෙකුගේ වී සමහර විට ශ්‍රේණි දෙකකට වර්ග කෙරෙන අවස්ථාද ඇත. වී වර්ග කිරීම ගැන මනා අවබෝධයක් සමහර කළමනාකරු වන්ට ඇත්දැයි සැකයක් ගොවි මහතුන් අතර පවතී.

3. බීජ වී අවශ්‍ය වෙලාවට ගොවි මහතුන් ලඟ මුදල් නැති නිසා, ඒ වෙනුවට තමන්ගේ වී කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානයට දී බීජ වී ලබා ගැනිමට ක්‍රමයක් ඇත්නම් හොඳ බව සමහර ගොවි මහත්වරුන්ගේ අදහසයි.

4. සමුපකාරයෙන් විකුණන පෝර මලුවල සමහර විට පොර වර්ගයේ නම සඳහන් කර නැති නිසා කළමනාකරු කියන දෙය පිළිගැනීමට ගොවි මහත්වරුන්ට සිදුවේ. මේ හේතුව නිසා බොහෝ වෙලාවල්වලදී තමන්ට උවමනා පෝර වර්ගය වෙනුවට වෙනත් වර්ගයක් ලැබෙන බව සමහර ගොවි මහත්වරු කියා සිටියා.

5. කිරි මණ්ඩලය වෙනුවෙන් කිරි මිළදී ගන්නා සමහර සමුපකාර සමිති ශත -/02 සිට -/04 දක්වා ගණනක් කොමිස් වශයෙන් අයකරති. පළාතෙන් පළාතට මෙසේ අය කරන ගණ නෙහි වෙනස්කම් තිබේ.

6. දකුණු පළාතේ කුඹුරු බොහොමයකට කරිජ්ජ ගලා ඒම බලවත් ප්‍රශ්නයකි. මේ නිසා හැම කන්නයක්ම වගේ පාළුවීම වැලැක්විය නොහැකිය. ඉක්මනින් පිළියමක් යෙදුවේ නැත්නම් තමන්ගේ කුඹුරු පුරන් වෙන්නට හරිනවා මිස වෙන කළ හැකි දෙයක් නැති බව ගොවි මහත්වරු කීපදෙනෙක් කියා සිටියා.

7. වතුර ලබා ගැනිමට අමාරු පළාත්වල ටිකක් වැඩියෙන් ගොවිතැන් කරන ගොවි මහත් වරු කීවේ පහසුවෙන් වතුර පොම්ප ලබා ගන්නට පුළුවන් නම් තමන්ගේ ගොවිතැන් කටයුතු මීට වඩා හොඳින් කරගෙන යන්නට පුළුවන් බවයි.

8. තමන් වගා කරන එළවලු වර්ග වෙළඳාම සඳහා පිට පළාත්වලට යැවීම ටිකක් කරදර සහිත ප්‍රශ්නයක් බව බොහෝ ගොවි මහත්වරු කීවා. මේ නිසා ඇතැම් විට තමන්ගේ පලදාව කුණු කොල්ලයට විකුණන්නට සිදුවන බව ඔවුහු කියා සිටියා.